චක්‍රලේඛ අංක.2005/1

මගේ අංකය: වි.උ.ම.එම්. 1/100
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නො.280, කෙළින් වීදිය,
කොළඹ 11.

2005.01.25

සියලුම උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## මුහුදු ගොඩ ගැලීමෙන් සිදුවූ හදිසි මරණ ලියාපදිංචි කිරීම

උක්ත කරුණ පිළිබඳව ඔබ වෙත එවන ලද මගේ අංක. විඋම/චක්‍රලේඛ/2004/01 හා 2005.01.07 දිනැති චක්‍රලේඛයට වැඩිදුරටත් ය.

02. ඉහත කරුණට අදාල හදිසි මරණ ලියාපදිංචි කිරීම පිළිබඳව මගේ ඉහත කී චක්‍රලේඛයේ 02 හා 03 ඡේදවලින් දී ඇති උපදෙස් නීතිමය ගැටළුවක් නිසා වහාම අවලංගු කරන බව කාරුණිකව දන්වමි.

03. ඒ අනුව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 30 වැනි වගන්තිය යටතේ බී.11 ආකෘතිය මගින් මෙම මරණ ලියාපදිංචි කිරීම වහාම අත් හිටුවන ලෙස දන්වමි.

04. එකී පණතේ 39 වැනි වගන්තිය යටතේ හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් නිකුත් කරනු ලබන මරණ පරීක්ෂණ වාර්තා මත පමණක් මෙකී මරණ අඛණ්ඩව ලියාපදිංචි කරන ලෙස කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.-දැ.ගැ.පි.
2. ලේකම්, අධිකරණ අමාත්‍යාංශය. - දැ.ගැ.පි.
3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්. - අ.ක.ස.
4. කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර ජනරාල්වරුන්. - අ.ක.ස.
5. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - අ.ක.ස.

නවි/25.